**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 35/92 (II)**

මගේ අංකය: IV/2/9/361/8(එච්)1/1
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995.06.26

සියලුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**රජයේ නිලධරයන් පිළිබඳව විනය පරීක්ෂණ ඉක්මන් කරවීම**
**<u>ආයතන සංග්‍රහය සංශෝධනය කිරීම XLVIII පරිච්ඡේදය.</u>**

ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදය සංශෝධනය කරමින් නිකුත් කරන ලද 1992.12.21 දිනැති අංක: 35/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 වන වගන්තිය කෙරෙහි ද 1994.11.28 දිනැති අංක 35/92(I) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි ද ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. 1990.08.17 දිනැති අංක:35/90 හා 1991.03.18 දිනැති අංක: 35/90 (I) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්හි සඳහන් නීතිඥ මණ්ඩල නිලධාරීන් වෙනුවට මින් ඉදිරියට මෙම චක්‍රලේඛයෙහි සඳහන් නීතිඥ නිලධාරීන් විනය පරීක්ෂණ සඳහා පත් කලයුතුය.

03. මෙම චක්‍රලේඛයේ සඳහන් නීතිඥ විනය පරීක්ෂණ නිලධාරීන් සඳහා පැමිණිල්ල මෙහෙයවන නිලධාරීන් වශයෙන් හෝ රැකවරණ නිලධාරීන් වශයෙන් හෝ කටයුතු කිරීමට බාධාවක් නොමැත.

04. මෙම පත්කිරීම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 35/92 හි 05 වන වගන්තිය පරිදි කලයුතු වේ.

05. රාජ්‍ය සේවයේ විනය පරීක්ෂණ කටයුතු මෙහෙයවීම සඳහා තෝරාගෙන ඇති නීතිඥ වෘත්තියේ දස වසරකට වඩා පලපුරුද්දක් ඇති නීතිඥයින්ගේ නාම ලේඛණයක් මේ සමඟ ඇති ඇමුණුමෙහි සඳහන් වේ.

06. රා.පරි.චක්‍ර. 35/90 හි සඳහන් විනය පරීක්ෂණ නිලධාරීන් දැනට විනය පරීක්ෂණ සඳහා පත් කර ඇත්නම් එම කටයුතු අවසාන වනතුරු පරීක්ෂණ පවත්වාගෙන යාමට මෙම චක්‍රලේඛය බාධාවක් නොවේ.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය